# බොරු වියදම් කරන්නේ නැතිව අලංකාර නිවසක් හදාගන්න පුළුවන්


නිදන කාමරයක්

## රන් දොරටුව

### පසන් නිවසක් ගැන සිහින මවන ඔබට මඟ පෙන්වීමක්


වාස්තු විද්‍යාඥ සුචිත් මොහොට්ටි නිර්මාණය කළ නිවසක තතු විමසමු

මෙ වර අපි ඔබට නවත් සුන්දර නිවහනක කලාත්මක සැලසුම් ශිල්ප ක්‍රම යොදාගෙන තිබෙන ආකාරය පිළිබඳ තොරතුරු ලබා දීමට බලාපොරොත්තු වෙනවා. මෙම අලංකාර නිවහන මේ ආකාරයෙන් නිර්මාණය කරනු ලැබුවේ ප්‍රවීණ වාස්තු විද්‍යාඥ සුචිත් මොහොට්ටි විසිනුයි.

මෙය තට්ටු දෙකක නිවහනක්. තරමක් විශාල ඉඩමක මෙම නිවස නිර්මාණය කොට තිබුණත් විශාල ඉඩ ප්‍රමාණයක් නිවස සෑදීම සඳහා යොදාගෙන තිබුණේ නැහැ. නිවසක් තැනීම වගේ ම නිවස අවට පරිසරය අලංකාරව තබා ගැනීම අත්‍යවශ්‍ය දෙයක්. මෙම නිවස ඉදිකිරීම සඳහා යොදා ගෙන තිබුණේ ඉතා අඩු බිම් කඩක්. මින් නිවස ඉදිරිපස වඩා ඉඩකඩ සහිතව ගස් වැල් වවා මනාව සකස් කිරීමට අවකාශ ලැබී තිබුණා.

මෙම නිවස පිහිටලා තිබෙන්නෙ බත්තරමුල්ල නාගරික වටපිටාවක් තුළ. ඒත් නිවස අවට පරිසරය සකස් කරගෙන තිබුණු ආකාරයෙන් නම් නාගරික පරිසරයක තිබෙන කලබලකාරී බව පෙනුණේ නැහැ. සෑම අතින් ම මෙම නිවස වඩාත් සැලසුම් සහගතව නිර්මාණය කර තිබෙනු අප දුටුවා. විශේෂයෙන් නිවස ඇතුළත හා බාහිර පරිසරය. මෙම නිවසේ නිර්මාණය කිරීමේ දි එහි ඇතුළත වගේ ම පිටත පරිසරය සකස් කිරීම සම්බන්ධයෙන් මෙහි ගෘහ නිර්මාණ කටයුතු කරනු ලැබූ සුචිත් මොහොට්ටි ගෙන් විමසුවා.

"මෙම නිවස නිර්මාණය කරන ලද ඉඩම වඩා ඉඩකඩ සහිත එකක්. ඉඩමට යාබදව වෙල් යායකුත් තිබුණා. මේ නිසා අවට පරිසරයේ තිබෙන සෞන්දර්ය සමග සබඳකමක් පවත්වා ගනිමිනුයි මෙම නිවහන නිර්මාණය කරන්න උත්සාහ කළේ. නිවසක් ඉදිකරන විට නිවසේ සිටින සාමාජික සංඛ්‍යාව වගේ ම වටපිටාව ගැන සැලකිලිමත් විය යුතුයි. ඉදිකරන්නන් වාලේ නිවාස ඉදිකිරීම අනුවණ ක්‍රියාවක්. ඒ වගේ ම නිවස අලංකාර කිරීමේ දී අනවශ්‍ය ලෙස මුදල් වැය කරමින් අනුකරණයක් කිරීමත් අපරාධයක්. ඉතාම සරලව නිවසක් තනා ගැනීම සෑම අතින් ම හොඳ දෙයක්. මේ නිසා මුදල් නාස්ති වෙන්නෙත් නැහැ. නිවසේ සෞභාග්‍යයට කලාත්මක බවට ඉන් හානියක් වෙන්නෙත් නැහැ."


නිවසේ පැති කඩක්

මෙම නිවස තුළ වර්ණ ගැන්වීමේත් විශේෂත්වයක් අප දුටුවා. නිවසේ ඉදිරිපස විවිධ වර්ණ යොදා වඩාත් ආකර්ෂණීය බවක් එක්කර තිබුණා. මේ පිළිබඳව ඔහු පැවසුවේ මෙවන් අදහසක්.

"නිවසක් වර්ණ ගැන්වීම තීරණය කළ යුත්තේ එය නිර්මාණය කරන ගෘහ නිර්මාණ ශිල්පියා ලවා ම යි. ඇත්තට ම නම් නිවස සැලසුම් කරන අවස්ථාවේ දී ම තමයි ඒ ඒ කොටස් සඳහා ගැළපෙන වර්ණය කුමක් ද කියල තීරණය කළ යුත්තේ. විවිධ වර්ගයේ වර්ණ නිවසකට යොදා ගත්තාට වරදක් නැහැ. මේ නිසා නිවසේ අලංකාර බවක් ආකර්ෂණීය බවක් කලාත්මක බවක් ඇති කරන්න පුළුවන්. ඒ වගේ ම බාහිර පරිසරයෙන් වෙන් කර වඩාත් ඉස්මතු කර පෙන්වීමටත් පුළුවන්. මේ නිසා මෙම නිවස සඳහා රෝස, දම්, කහ, නැඹිලි කොළ යනාදී විවිධ වර්ණ භාවිතා කළා."

මීළඟට මෙම නිවහනේ වහල නිර්මාණ කර තිබෙන ආකාරයෙත් අපි විශේෂත්වයක් දුටුවා. මේ සම්බන්ධව සුචිත් මහතා පළ කළේ මෙවන් අදහසක්.

"මෙම නිවස සඳහා තනි පළේ වහලක් තමයි නිර්මාණය කළේ. සෙවිලි කර තිබෙන්නේ ඇස්බැස්ටෝස්වලින්. මෙහි වහල කොටස්වලට වෙන් වෙලා නැහැ. මෙය ඉතා ම සරල වහලක්. මේ නිසා වැහි පීලි වුවත් ඉතා ම අඩුවෙන් තමයි අවශ්‍ය වෙන්නෙ. ඒ වගේ ම වහලය මත කුණු රොඩු රැඳෙන්නෙත් නැහැ. නිවසකට වහලක් නිසියාකාරව නොයෙදුවහොත් කොයි තරම් නිවස අලංකාර කළත් පලක් වන්නේ නැහැ."


නිවසේ පැති පෙනුම

මෙම නිවසේ පහළ තට්ටුවේ හා ඉහළ තට්ටුවේ සම්පූර්ණයෙන් ම වීදුරු යෙදූ ජනේල භාවිතා කරල තිබුණා. ජනෙල් සඳහා වැඩි අලංකරණ කටයුතු කිසිවක් සිදු කරල තිබුණේ නැහැ. මේ පිළිබඳවත් සුචිත් මොහොට්ටිගෙන් විමසුවා.

නිවසක් බිත්තිවලින් වටකර තබා ගැනීමට වඩා පිටත පරිසරය ඒ ආකාරයෙන් පෙනෙන පරිදි සකසා තිබීම වඩාත් හොඳයි. මෙම නිවසේ ආලින්දය, විසිත්ත කාමරය, කෑම කාමරය, මුළුතැන්ගෙය, රූපවාහිනී නරඹන කාමරය යනාදි සියල්ලට ම ඉතා හොඳින් පිරිසිදු වාතාශ්‍රය හා ආලෝකය ලැබෙන්න ඕන නිසා තමයි මේ ආකාරයෙන් ජනෙල් භාවිතා කළේ. මේ නිසා මෙම නිවහනේ දවල් කාලයට කිසිම අවස්ථාවක දී විදුලි බල්බ දැල්වීම අවශ්‍ය වන්නෙ නැහැ.

මෙහි ජනෙල් සඳහා ග්‍රිල් වර්ගයක් වත් භාවිතා කළේ නැහැ. මුදල් ඉතා අඩුවෙන් වියදම් වෙන ආකාරයට තමයි සැලසුම් කළේ. පිටත පරිසරයේ ගස් කොළත් පිස හමා එන සුළඟ නිතර ම නිවසට ගලා එන නිසා සිසිලසක් දැනෙනවා.

මෙම නිවහනේ විසිත්ත කාමරය තුළ කුඩා පොකුණක් (pond) නිර්මාණය කරල තිබුණා. එය ගැන පැහැදිලි කළ ඔහු...

මෙම පොකුණ නිර්මාණය කළේ නිවස තුළ සිසිල් බවක් ඇති කරන්නත් ඒ තුළ දියේ වැවෙන ගස් කොළත් වවා ගැනීමත් සඳහා යි. පොකුණ අසල ම තරමක් ගණ බිත්ති කොටසක් තිබෙනවා. ඒ බිත්තියෙන් නිතර ම වතුර බිංදු පොකුණට ගලා යන විදියටයි නිර්මාණය කළේ. මෙහි එක් රැස් වන වැඩි වතුර ඩවසින් පිටතට ගලාගෙන යාමට වෙන ම ජල නලයක් භාවිතා කළා.'

'මෙම නිවසේ ආලින්දය වඩාත් ඉඩකඩ සහිතව නිර්මාණය කරල තිබුණ. අමුත්තන් විශාල ප්‍රමාණයකට එකවර හිඳ ගැනීමට මේ නිසා පුළුවන් වී තියෙනවා. ඒ වගේ ම නිවසේ අයට රූපවාහිනී නැරඹීම සඳහා වඩාත් ඉඩකඩ සහිතව නිදහස් කොටසක් උඩු මහලේ නිර්මාණය කර තිබුණා.

මෙම නිවස නිර්මාණයේ දී ජනේල භාවිතයට අමතරව වීදුරු ගල් (glass blocks)බොහෝ තැන්වල යොදා ගෙන තිබුණා. මේ නිසා නිවසට ආලෝකයක් හා දැකුම්කළු බවක් ඇතිවෙන බවයි ගෘහ නිර්මාණ ශිල්පියා පවසන්නේ.

නිවසක් ඉදිකර ගැනීමට විශාල මුදල් ප්‍රමාණයක් වැය කරන්නට සිදු වුණත් එය මනාව සකස් කර ගත්තේ නැත්නම් ජීවිතේ හැමදමත් පසු තැවෙන්න සිදු වේවි. ඒ වගේ ම නිවහනකට අනවශ්‍ය ආකාරයෙන් අලංකරණ යොදා ගැනීම නිසා අමතර වියදමක් දරන්න වෙනවා. මේ නිසා ඉතා ම සරල ව තමන් ගේ පවුලේ සාමාජික පිරිසට ප්‍රමාණවත් සුන්දර නිවහනක් ඉදි කර ගැනීම හැම දෙනා ගේ ම අනාගතයට යහපතක් වගේ ම ආශිර්වාදයක් ද වනු ඇත.

**අශෝකා විජේසේකර**

> **"නිවසක් වර්ණ ගැන්වීම තීරණය කළ යුත්තේ එය නිර්මාණය කරන ගෘහ නිර්මාණ ශිල්පියා ලවා ම යි. ඇත්තට ම නම් නිවස සැලසුම් කරන අවස්ථාවේ දී ම තමයි ඒ ඒ කොටස් සඳහා ගැළපෙන වර්ණය කුමක් ද කියල තීරණය කළ යුත්තේ. විවිධ වර්ගයේ වර්ණ නිවසකට යොදා ගත්තාට වරදක් නැහැ.**


නිවසේ ඉදිරි පෙනුම